www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් -- 1 වන කොටස

**The Historical and International Foundations of the Socialist Equality Party—Part 1**

*එක්සත් ජනදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් ලියවිල්ල කොටස් වසයෙන් පල කිරීම අපි අදින් ආරම්භ කරමු. පසුගිය අගෝස්තු 3-9 දිනවල පැවති සසප ආරම්භක සම්මේලනයේ දී මෙම ලියවිල්ල පුලුල් ලෙස සාකච්ඡා කරනු ලැබ ඒකමතිකව සම්මත කර ගන්නා ලදි. සම්මේලනයේ දී සම්මත කෙරුනු සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ද මීට පෙර ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පල විය.*

## සමාජවාදී සමානතා පක්ෂයේ සප්‍රතිපත්තිමය අත්තිවාරම්

1. සසපයේ ක්‍රියාමාර්ගය ප්‍රතිපත්තිමය ස්වභාවයක් දරයි; එය සංසන්ධිමය හෝ තත්කාර්යවාදීමය නො වේ. එය වර්ධනය කර ගනු ලැබ ඇත්තේ ලෝක ධනවාදයේ වෛෂයික අර්බුදය පිලිබඳ විශ්ලේෂනයක පදනම් මත ද කම්කරු පන්තියේ හා ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයේ වැදගත් මූලෝපායාත්මක අත්දැකීම් අවශෝෂනය කර ගැනීම මත ද වේ. ලෝක ආර්ථික සහ දේශපාලන පද්ධතිය, එහි අතිමූලික ගතිලක්ෂනයන් අතින් ගත් කල්හි අධිරාජ්‍යවාදී වේ. තාක්ෂනයේ යෝධ ඉදිරි පියවරයන් ද, නිෂ්පාදන බලවේගයන්ගේ පෘථුල වර්ධනය ද භූගෝලය පුරා ම ධනේශ්වර නිෂ්පාදන සම්බන්ධතා පැතිරී යාම ද යන මේ සියල්ල තිබිය දී ම අද දින ලෝක ධනවාදී පද්ධතිය සාරභූත වශයෙන් ගත් කල්හි, 20 වන ශතවර්ෂයේ දී ලෝක යුද්ධ දෙකක් ද, ෆැසිස්ට්වාදය ද, තථ්‍යසමව නිමක් නැති ප්‍රදේශීය යුද ගැටුම් මාලාවක් ද, ගනන් නැති මෘග දේශපාලන ඒකාධිපතිත්වයන් ද පැන නැංවූ එම පුපුරන සුලු සහ විසඳිය නොහැකි ප්‍රතිසතිතාවන් විසින් අරක්ගනු ලැබ පවතී.

2. පලමුවන ලෝක යුද්ධය සමයේ ලෙනින් විසින් හඳුනා ගනු ලැබුනු, නිෂ්පාදනයේ ඒකාධිකාරී සංකේන්ද්‍රනය මූල්‍ය ප්‍රාග්ධනයේ ආධිපත්‍යය සහ ආර්ථික පරපෝෂිතතාව, භූදේශපාලනික ආධිපත්‍යය සඳහා මහ බලවතුන්ගේ වෛරදැරීම, වඩා දුර්වල ජාතීන් පීඩනයට ලක් කිරීම සහ දේශපාලන ප්‍රතිගාමිත්වය දෙසට පවත්නා සර්වත්‍රික ප්‍රවනතාවය යන අධිරාජ්‍යවාදයේ එම කේන්ද්‍රීය ලක්ෂනයන්ම, වත්මන් ලෝක ආර්ථික හා දේශපාලන පර්යාය ද නිර්වචනය කරයි. 1914 පලමුවන ලෝක යුද්ධය හා 1939 දෙවන ලෝක යුද්ධය අද්දර දී ද, අද දින ද, මූලික ප්‍රතිසතිතාවන් පවත්නේ භූගෝලීය ආර්ථිකය සහ ජාතික රාජ්‍ය පද්ධතිය අතර ද, සමාජීකෘත නිෂ්පාදනය සහ නිෂ්පාදන බලවේග පෞද්ගලික අයිතියට නතුවී පැවැත්ම අතර ද වේ. කර්මාන්තය හා මූල්‍යය සමාජයීකරනයෙන් ද, කම්කරු පන්තියේ සමාජයීය ධාරිතාවය ඉහල නංවමින් හා ආර්ථික ජීවිතය භූගෝලීයකරනයෙන් ද අධිරාජ්‍යවාදී යුගය, ධනවාදය පෙරලා දැමීම සඳහා වෛෂයික පදනම් ද සම්පාදනය කලේය.

3. 1991 සෝවියට් සංගමය බිඳ වැටීමෙන් ඉක්බිත්තෙහි, ධනේශ්වරයේ දෘෂ්ටිවාදියෝ ද ක්ෂමාලාපකයෝ ද 'ඉතිහාසයේ සමාප්තිය' නිවේදනය කලහ. ඔවුන් එයින් අදහස් කලේ "සමාජවාදයේ අවසානය" සහ ධනවාදයේ අවසාන ජයග්‍රහනය යි. එහෙත් ඉක්බිති සිද්ධීන්ගෙන් දැනට ම විදර්ශනය වී ඇත්තේ ඉතිහාසය ම පමනක් නොව, විප්ලවය පිලිබඳ මරන නිවේදනයන් ද තීන්දු වශයෙන් උවමනාවට වඩා හදිස්සිව කරන ලද ඒවා බවය. 21 වන සියවස 20 සියවස තරම්ම කෝලාහලකාරී වනු ඇත. ජාත්‍යන්තර කම්කරු පන්තිය කලින් පරම්පරාවන් විසඳ ගැනීමට අසමත් වූ ඓතිහාසික ගැටලුවලට මුහුන දී සිටී.

4. විප්ලවවාදී සමාජවාදී මූලෝපාය වර්ධනය කල හැකි වන්නේ අතීත අරගලවල පාඩම් මත පමනි. අන් සියල්ලට මත් වඩා සමාජවාදීන් අධ්‍යාපනගත කර ගැනීමේ ලා, හතර වන ජාත්‍යන්තරයේ ඉතිහාසය පිලිබඳ සවිස්තර ඥානයක් අත්‍යවශ්‍ය වේ. සමාජවාදී විප්ලවයේ න්‍යායික හා දේශපාලන හී තුඩ වූ මාක්ස්වාදය එහි වඩාත්ම තියුනු මුවහත අත් කර ගෙන ඇත්තේ 1938 දී ආරම්භ කරනු ලැබූ හතර වන ජාත්‍යන්තරය, එතැන් පටන් ස්ටැලින්වාදයට, ප්‍රතිසංස්කරනවාදයට, පැබ්ලෝවාදයට සහ වෙනත් සකල වර්ගවල දේශපාලන අවස්ථාවාදයන්ට එරෙහිව නිමග්න වූ අරගලයන් තුලිනි.

5. ක්‍රියාමාර්ගය හා කර්තව්‍යයන් පිලිබඳ අවශ්‍ය කාරනා මත පක්ෂය තුල දේශපාලන එකඟත්වය, 20 වන සියවසේ ඓතිහාසික අත්දැකීම් හා ඒවායේ

කේන්ද්‍රීය මූලෝපායාත්මක පාඩම් පිලිබඳ පොදු ඇගැයුමක පදනම මත හැරෙන්නට අත් කර ගත නොහැකි ය. වරෙක රෝසා ලක්ෂම්බර්ග්, ඉතිහාසය වනාහි කම්කරු පන්තියේ "වියා ඩොලරෝසාව" (මහා ගමන් පථය) යනුවෙන් විස්තර කලා ය. කම්කරු පන්තිය, ජයග්‍රහනයන්හි පාඩම් පමනක් නොව පරාජයන්හි පාඩම් ද ඇතුලුව ඉතිහාසයේ පාඩම් උගන්නා තරමට පමනක්, එම පන්තියට විප්ලවවාදී අරගලයේ නව කාල පරිච්ඡේදයක් විසින් ඉදිරිපත් කරනු ලබන්නා වූ නව අභියෝගයන් සඳහා සූදානම් විය හැකිය.

## 20 වන ශතවර්ෂය ආරම්භයේ මාක්ස්වාදය

6. අධිරාජ්‍යවාදය එහි නූතන ස්වරූපයෙන් පැන නැංගේ 19 වන ශතවර්ෂයේ අවසාන දශකයන් තුල දී ය. ධනේශ්වර කර්මාන්තයෙහි ප්‍රසාරනය හා සමග කම්කරු පන්තියේ වැඩියාමක් ද යුරෝපයේ හා උතුරු ඇමරිකාවේ නව කාර්මික කම්කරු පන්තිය තුල පන්ති අරගලය පුපුරා යාමක් ද සිදු විය. මෙම ඓතිහාසික සන්තතිය මාක්ස්වාදයේ සංවර්ධනය විසින් පූර්වාපේක්ෂා කරනු ලැබ තිබුනි. 1847 නොවැම්බරයේ *කොමියුනිස්ට් ප්‍රකාශනය* පල කරන ලද්දේ කම්කරු පන්තියේ ප්‍රථම මහා විප්ලවවාදී අරගලයන්ගේ මුවවිටෙහි ම ය. කාර්ල් මාක්ස් සහ ෆෙඩ්රික් එංගල්ස්, ඓතිහාසික සන්තතිය පාලනය කරන්නාවූ වෛෂයික නීතින් සොයා ගත් අතර එමගින් පොදුවේ මානුෂික තත්වය නගා ලීම පිලිබඳ මනෝරාජික ව්‍යාපෘතීහු අතික්‍රමනය කරන ලදහ. එංගල්ස් තම සම්භාව්‍ය කෘතිය වූ *Anti-DÜhring* (ඩූරිං ට ප්‍රතිපක්ෂව) හි පැහැදිලි කල පරිදි ඉතිහාසය පිලිබඳ මාක්ස්වාදී සංකල්පය මෙසේ තහවුරු කලේ ය.

> ...දේවල් නිෂ්පාදනය කිරීම ද, ඊලඟට නිෂ්පාදනය කරන දේ හුවමාරු කිරීම ද සකල සමාජ ව්‍යුහයේ ම පදනම ය; ඉතිහාසයේ පැන නැගි සෑම සමාජයකම, ධනය නිෂ්පාදනය කරන ආකාරයත්, සමාජය පන්ති හෝ පැලැන්ති ලෙස බෙදී ඇති ආකාරයත්, රැඳී පැවතියේ, නිෂ්පාදනය කරනු ලබන්නේ කුමක් ද, එය කරනු ලබන්නේ කෙසේ ද, නිෂ්පාදනයන් හුවමාරු කරනු ලබන්නේ කෙසේ ද යන්න මතය. මෙම දෘෂ්ටි ආස්ථානයෙන්, සියලු සමාජමය වෙනස්වීම්වල සහ දේශපාලන විප්ලවයන්හි අවසාන හේතූන් සොයා ගත යුත්තේ මිනිසුන්ගේ ඉස්මොල තුල ද, සැබෑ සත්‍යය හා යුක්තිය පිලිබඳ මිනිසුන් ලබා ගන්නා අභිනිවේෂයන් තුල ද නොව, ඒ ඒ දෙන ලද යුගයක නිෂ්පාදන හා හුවමාරු විධීන්ගේ වෙනස්කම් තුල ය. ඒවා සෙවිය යුත්තේ දර්ශනවාදය තුල නොව එක් එක් දෙන ලද *ආර්ථිකය* තුල ය. පවත්නා සමාජ සංස්ථාවන් අහේතුකය, අයුක්තිසහගතය, හේතු තර්කය අහේතු තර්කයක් බවට පත්ව ඇත, යුක්තිය අයුක්තිය බවට පත්ව ඇත, යන්න වඩ වඩාත් පැහැදිලිව පෙනී යාම වනාහී, නිෂ්පාදන හා හුවමාරු විධීන් හි නිශ්ශබ්දව සිදුවී ඇත්තාවූ වෙනස්කම්, කලින් පැවති ආර්ථික තත්වයන්ට අනුගතව පැවති සමාජ පර්යායට නොගැලපෙන තත්වයකට පත්ව ඇති බව ය. මෙයින් ගලා එන්නා වූ තවත් කරුනක් නම් අනාවරනය වී ඇති පරස්පරතාවන් ගෙන් අත්මිදීමේ මාධ්‍යයන් ද අඩු හෝ වැඩි වශයෙන් සංවර්ධිතව, එම වෙනස්වූ නිෂ්පාදන විධීන් තුල ම පැන නැග පැවතිය යුතුය යන්න ය. මෙම මාධ්‍යයන් *ඔලුගෙඩි තුලින් ගොතාගෙන සොයාගත යුත්තේ නොවේ. ඒ වෙනුවට නිෂ්පාදනයේ* භෞතික ද්‍රව්‍යමය කාරනා තුලින් මොලයේ ආධාරයෙන් *සොයාගත යුතුය.*[1]

7. 1867 *කැපිටාල්* ග්‍රන්ථය පලකිරීම කම්කරු පන්තියට ධනේශ්වර නිෂ්පාදන විධිය හසුරවන්නාවූ නියාම පිලිබඳ වැටහීමක් සම්පාදනය කලේ ය. මාක්ස්ගේ මහා කෘතිය සැලකියයුතු කම්කරු පන්තික ශ්‍රාවකයක අවධානය දිනා ගැනීමට අවුරුදු ගනනාවක්ම ගතවූ නමුත්, කැපිටාල් ග්‍රන්ථය නූතන සමාජවාදී ව්‍යාපාරයේ වර්ධනය සඳහා විද්‍යාත්මක පදනමක් තහවුරු කලේ ය. විශේෂයෙන්ම ජර්මනියේ කම්කරු පන්තියේ පුලුල් කොටසක් මාක්ස්වාදයේ අනුහසට පාත්‍රවූ අතර යුරෝපය පුරාම පෘථුල සමාජවාදී පක්ෂ පිහිටුවීමට අවශ්‍ය වන සමාජ හා න්‍යායික අත්තිවාරම් පැන නැගුනි. 1889 දී දෙවන ජාත්‍යන්තරය පිහිටුවීම ජාත්‍යන්තර කම්කරු පන්තියේ දේශපාලන එක්සත් භාවය සඳහා අරගලයේ ඓතිහාසික සැතපුම් කනුවක් විය. 1864 දී මාක්ස් හා එංගල්ස් පලමුවන ජාත්‍යන්තරය පිහිටවූ සමයේ පැවති තත්වයට වඩා, ධනවාදයේ වර්ධනය ද, කාර්මික කම්කරු පන්තියේ වර්ධනය ද සම්බන්ධයෙන් බෙහෙවින් මුහුකුරාගිය තත්වයක් මත ය දෙවන ජාත්‍යන්තරය පදනම් වූයේ. පලමුවන ජාත්‍යන්තරය විසුරුවා ලූ 1876 සහ දෙවන ජාත්‍යන්තරය ඇරඹූ 1889 අතරතුර කාල පරිච්ඡේදය, ධනේශ්වර ක්‍රමයේ ද කාර්මික ධනපති පන්තියේ ද ඉමහත් වර්ධනයක් අත්දුටුවේ ය. ඊලඟ ශතවර්ෂ කාල ධනපති ක්‍රමයේ සමාජ, ආර්ථික සහ දේශපාලන වර්ධනයේ ද ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ ද පරස්පරවිරෝධී ප්‍රවනතාවයන් විසින් සංලක්ෂිත විය. මතුපිට තලයේ දී මෙම කාල පරිච්ඡේදයෝ ආධිපත්‍යය දැරූ අංගයන් වූයේ, ආර්ථික වර්ධනය සහ දේශපාලන ස්ථාවරත්වයයි. මෙම රාමුව තුල, විශේෂයෙන්ම බටහිර යුරෝපයේ සංවිධිත කම්කරුවන්ගේ ව්‍යාපාරය පාර්ලිමේන්තුවාදී හා වෘත්තීය සමිති පිලිවෙත් තුලින් පෙරට ගියේ ය.

කෙසේ වෙතත්, ආර්ථික පර්යායේ දෘෂ්‍යමාන ස්ථාවරත්වයට යටින් අතිමහත් අභ්‍යන්තර පීඩනයෝ ගොඩනැගෙමින් පැවැත්තාහ. 19 වන ශතවර්ෂයේ අවසාන දශකය තුල ද, 20 වන ශතවර්ශයේ ප්‍රථම දශකය තුල ද, අධිරාජ්‍යවාදයේ වැඩී ඒම, ප්‍රමුඛ ධනපති රාජ්‍යයන් අතර භයංකර ප්‍රතිමල්ලතාවන් උග්‍රවීම සමග එකට බැඳී පැවැතුනි. ඒ සමග ම, ආර්ථික ආතතීහු පන්ති සම්මුතියේ පදනම්වලට වල කපමින් පන්ති ආතතීන් හි උග්‍ර වීමක් සලකුනු කලාය.

8. මෙම පරස්පරවිරෝධී වර්ධනයට යටින්, විශේෂයෙන්ම ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂය හා (එස්පීඩිය) දෙවන ජාත්‍යන්තරය තුල වැඩී ගිය ආතතීන් පැවතියේය. එස්පීඩීයේ නිල න්‍යාය වූයේ පන්ති යුද්ධයේ න්‍යායයි; එහෙත් එම පක්ෂයේ ම වර්ධනය බැඳී පැවැත්තේ ජර්මානු ධනවාදය ද එහි ජාතික කර්මාන්ත ද යන දෙක්හි ප්‍රසාරනයටයි. එම ප්‍රසාරනය විසින් ඒ සමග ම කම්කරු පන්තිය ද වෘත්තීය සමිතීන් ද ශක්තිමත් කරනු ලැබීය. මෙම වැඩීමේ (හා ප්‍රසාරනයේ) කාල පරිච්ඡේදය ධනපති පන්තියට කම්කරු පන්තියේ අංශයක් ද වෘත්තීය සමිති නිලධරයක් ද (ලෙනින් මේවා නම් කලේ 'කම්කරු රදල පෙල' යනුවෙනි.) හදාවඩා ගනිමින් එම පෙලැන්තියේ ආසක්තතාවන් ධනේශ්වර පද්ධතියට ගැට ගසා ගත හැකි තත්වයක් ලබා දුනි. සැම රටක් තුලම ප්‍රකාශිත වූ, දෙවන ජාත්‍යන්තරය තුල අවස්ථාවාදය වැඩී ඒමේ පදනම වූයේ මෙයයි. මෙම අවස්ථාවාදය එඩුවාර්ඩ් බර්න්ස්ටයින්ගේ ලේඛන තුල එහි අතිශයින්ම සංවර්ධිත න්‍යායික ප්‍රකාශනය අත්කර ගත්තේ ය. ධනේශ්වර පද්ධතියේ වෛෂයික ප්‍රතිසතිතා ද ඒවායේ විප්ලවීය ගම්‍යතාවන් ද ඔහු විසින් ප්‍රතික්ෂේප කරන ලදී. මෙම තර්කයෝ මාක්ස්වාදී භෞතිකවාදයට සතුරු ආත්මීය විඥානවාදී දර්ශනවාදයේ විවිධ රූපාකාරයන්, විශේෂයෙන්ම නව්‍ය-කාන්ට්යානුවාදයේ පෘථුල බලපෑම් පිලිබිඹු කලාහ.

9. ප්‍රතිමාක්ස්වාදී සංශෝධනවාදී ප්‍රවනතාවයන් අත් කරගත් බලපෑම විසින් පෙන්නුම් කරන ලද්දේ ඒවායේ බුද්ධිමය බලය නොවේ; ඇත්ත වශයෙන්ම ඒවා අනුසන්ධානයෙන් තොර බවින් ද ආවේගවාදී බවින් ද නම් දරාපු ප්‍රවනතාවයන් ය. සංශෝධනවාදය තම ශක්තිය ලබාගත්තේ එවක කම්කරු පන්තිය, සමාජවාදීන් විසින් මෙහෙයවනු ලැබූවත් එම පන්තියට ධනේශවර සමාජයට එරෙහි විප්ලවවාදී ප්‍රහාරයක් සඳහා සැබෑ අවස්ථාවක් අත්කර නුදුන් වෛෂයික තත්වයන්ගේ පදනම උඩය. මේ වනාහී විශේෂයෙන්ම ජර්මනිය තුල සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය ඇතුලත පැනනැංගාවූ එක්තරා අරුම දෙබිඩි බවකි. සමාජ ප්‍රජාතන්ත්‍රයේ නායකයෝ විප්ලවීය මාක්ස්වාදයේ භාෂාව පාවිච්චි කලෝ ය. එහෙත් දෛනික දේශපාලන කටයුතු ගමන් කලේ ප්‍රතිසංස්කරනවාදයේ සීමාවන්තුල ය. බර්න්ස්ටයින්ගේ සූත්‍ර ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රකාශයේ ද, වෘත්තීය සමිතිවල ද, ප්‍රතිසංස්කරනවාදී ස්වභාවය පිලිබිඹු කරමින් යුක්ති සහගත කලේ ය. මෙම න්‍යායික සංශෝධනයන්ගේ දේශපාලන ඇඟැවුම් 1899 ප්‍රන්සයේ දී සමාජවාදී නායක මිලරෝං ධනේශ්වර ආන්ඩුවක ඇමතියෙක් වීමත් සමග පැහැදිලි ප්‍රකාශනයක් අත් කර ගති.

## බොල්ශෙවික්වාදයේ ප්‍රභවයෝ

10. බොල්ෂෙවික් පක්ෂය පැන නැංගේ රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ඇතුලත අවස්ථාවාදී හා සංශෝධනවාදී ප්‍රවනතාවයන්ට එරෙහිව දේශපාලන වශයෙන් ලෙනින් විසින් (සහ දර්ශනවාදයේ ක්ෂේත්‍රයේ ප්ලෙහානොව් විසින්) නායකත්වය දෙනු ලැබූ අරගලය තුලිනි. ලෙනින් (එස්පීඩියේ ප්‍රධාන න්‍යායඥයා වූ කාර්ල් කවුට්ස්කි කලින් වර්ධනය කල ආස්ථානය මත පදනම් වී ගෙන) සමාජවාදී විඥානය කම්කරු පන්තිය තුල ස්වයංසිද්ධව වර්ධනය වන්නේ නැතැයි ද, එම විඥානය කම්කරු ව්‍යාපාරය ඇතුලතට පිටත සිට ගෙන ආ යුතුව ඇතැයි ද අවධාරනය කලේ ය. *කල යුත්තේ කුමක් ද* යන තම කෘතිය තුල ලෙනින් ඔීස්ට්‍රියානු සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂයේ ක්‍රියා මාර්ගයෙන් උපුටාගත් පහත දැක්වෙන තීරනාත්මක ඡේදය ගෙන හැර දැක්වීය:

> නවීන සමාජවාදී විඥානය ඇතිවිය හැක්කේ, ගැඹුරු විද්‍යාත්මක දැනුම පදනම් කරගෙන පමනකි. නවීන ආර්ථික විද්‍යාව ද, නවීන තාක්ෂනික ශිල්පය තරමට ම, සමාජවාදී නිෂ්පාදනය සඳහා ඇත්තෙන්ම අවශ්‍ය වන කොන්දේසියකි. නිර්ධන පන්තිය කොතරම් ආශා කලත්, එයට ඒ දෙකෙන් එකක්වත්, නිර්මානය කර ගත නොහැක. ඒ දෙකම පැන නගින්නේ, නවීන සමාජ ක්‍රියාදාමයෙනි. විද්‍යාවේ ප්‍රගමනය සිදු වන්නේ නිර්ධන පන්තිය නමැති වාහනයෙන් නොවේ; ධනේශ්වර බුද්ධිමතුන් මගිනි. (අවධාරනය කාල් කවුට්ස්කිගේය.) සමාජවාදය පිලිසිඳ ගත්තේ මෙම ස්ථරයේ එක් එක් සාමාජිකයන්ගේ සිත් තුල ය. ඔවුන් ඒ ගැන බුද්ධි වර්ධනය ලත් නිර්ධන පන්තියට දැන්වූ පසු, තත්වය අනුව හා ඉඩකඩ ඇති ලෙසට ඒ අය විසින් එය පන්ති අරගලය සඳහා යොදා ගන්නා ලදී. එනිසා, සමාජවාදී විඥානය යනු, නිර්ධන පන්ති අරගලයට පිටතින් ඇතුල් කරන ලද්දක් මිස, එය අභ්‍යන්තරයෙන් සාංසිද්ධිකව පැන නැගුනු දෙයක් නොවේ.[2]

11. විප්ලවවාදී පක්ෂයේ කේන්ද්‍රීය කර්තව්‍යය වූයේ කම්කරුවන්ගේ ව්‍යාපාරය මාක්ස්වාදී න්‍යායෙන්

සන්තෘප්ත කර ලීමය. "වැඩ කරන ජනතාවගේ අරගලය අතරතුර ඔවුන් විසින් ම සකස් කර ගත හැකි දෘෂ්ටියක් ගැන කීමට නොහැකි හෙයින්, තෝරා ගැනීමට තිබෙන්නේ එක්කෝ ධනපති දෘෂ්ටිය, නැතහොත් සමාජවාදී දෘෂ්ටිය යන දෙකෙන් එකක් පමනකි. මැද මාර්ගයක් නොමැත (මිනිසා "තුන්වැනි" දෘෂ්ටියක් නිර්මානය කර නොමැත. එපමනක් නොව, පන්ති ප්‍රතිරෝධතාවයන්ගෙන් බෙදී ගිය සමාජයක, පන්තියකට අයත් නැති, නැතහොත් පන්ති අභිබවා සිටින දෘෂ්ටියක් තිබෙනු ද නොහැකි ය.) එහෙයින්, කුමන ආකාරයකින් වුව ද සමාජවාදී දෘෂ්ටිය ලඝු කොට දැක්වීමක්, ලේශ මාත්‍ර වශයෙන් හෝ ඉන් ඉවතට හැරීමක් යනුවෙන් අදහස් වන්නේ, ධනේශ්වර දෘෂ්ටිය ශක්තිමත් කිරීම ය."[3] තමන්ගේ වැඩ කටයුතු කම්කරු පන්තික ක්‍රියාකාරකම්වල ස්වයංසිද්ධ රූපයන්ට අනුගත කරමින්, සමාජ විප්ලවයේ ඓතිහාසික අරමුනෙන් දෛනික ප්‍රායෝගික අරගලය වෙන් කර දැමුවා වූ, සෑම සියලු ප්‍රවනතාවයන්ට ම ලෙනින් විරුද්ධ විය. තම සමයේ අන් සියලු මාක්ස්වාදීන්ට වඩා පැහැදිලිව, කම්කරු පන්තිය තුල මාක්ස්වාදයේ සංවර්ධනය සඳහා, ධනේශ්වර හා මධ්‍යම පන්තික ප්‍රවනතාවයන් විසින් ඇති කරනු ලබන දේශපාලන හා දෘෂ්ටිමය පීඩනයන්ට එරෙහිව, නිරන්තර අරගලයක් ඉල්ලා සිටි බව ලෙනින් වටහාගත්තේ ය. න්‍යාය, දේශපාලන මූලෝපාය, හා පක්ෂ සංවිධානය යන ප්‍රයුක්තයන් පිලිබඳ විවිධ රූපාකාරයන්හි සංශෝධනවාදයන්ට සහ අවස්ථාවාදයන්ට එරෙහිව කරන ලද අරගලයේ සාරභූත අර්ථභාරය පැවතියේ මෙතැන ය.

12. 1903 දී පැවැත්වුනු රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ලේබර් (ආර්එස්ඩීඑල්පී) පක්ෂයේ දෙවන සම්මේලනය අවසන් වූයේ බොල්ශෙවික් හා මෙන්ෂෙවික් ප්‍රවනතා අතර භේදයකිනි. එය විප්ලවවාදී මාක්ස්වාදී ව්‍යාපාරයේ ඉතිහාසයේ සන්ධිස්ථානයක් සලකුනු කලේ ය. භේදය හදිසියේ පැන නැගි නමුත්, පක්ෂ නීති හා සංවිධානයට සම්බන්ධ ද්විතීයික ප්‍රශ්න සේ පලමුවෙන් පෙනී ගිය ද, එන්න එන්නම පැහැදිලි වූ කරුනු නම් සට්ටනය ආර්එස්ඩීඑල්පී පක්ෂය තුල අවස්ථාවාදය පිලිබඳ ප්‍රශ්නය හා ඉන් ඔබ්බට, දේශපාලන ඉදිරිදර්ශන හා ක්‍රියාමාර්ගය පිලිබඳ ප්‍රශ්න සමග බැඳී පැවති බව පැහැදිලි විය. සංවිධානාත්මක ප්‍රශ්නය සම්බන්ධයෙන් ගතහොත්, ලෙනින් සිය *පියවරක් ඉදිරියට, පියවර දෙකක් පස්සට* යන කෘතියේ දී පැහැදිලි කල පරිදි "වැඩපිලිවෙලේ අවස්ථාවාදය ස්වභාවයෙන්ම උපක්‍රමවල අවස්ථාවාදය සහ සංවිධානයේ අවස්ථාවාදය සමග ස්වාභාවික ලෙස වෙලී පවතී."[4] ඔහු තව දුරටත් මෙසේ ද කීය: "වැඩ පිලිවෙලෙහි, උපක්‍රමවල හෝ සංවිධානයෙහි නොදියුනුභාවය, ඕනෑම පක්ෂයක අවස්ථාවාදී අංශය විසින් නිතරම ආරක්ෂා කිරීමත්, එය සාධාරන යැයි පෙන්වීමත් කරනු ලැබේ."[5] ලෙනින් තම විශ්ලේෂනය අමතක නොකටයුතු ප්‍රකාශයකින් සමාප්ත කලේ යඃ

> බලය අල්ලා ගැනීම සඳහා කරන සටනේ දී නිර්ධන පන්තියට සංවිධානය හැර අන් කිසි අවියක් නොමැත. ධනවාදී ලෝකයේ අරාජිකවාදී තරගයේ පාලනය නිසා අසමගි වී සිටින, ප්‍රාග්ධනය සඳහා බලාත්කාරයෙන් ශ්‍රමය වැය කිරීමට යට වී සිටින, අන්ත දුගී බවේත්, ම්ලේච්ඡත්වයේත්, දිරාපත්වීමේත් "පාතාලයට" නිරතුරුව ම තල්ලු කරනු ලබන නිර්ධන පන්තියට, නොවැලැක්විය හැකිසේ අනභිබවනීය බලවේගයක් බවට පත්විය හැක්කේත්, එසේ වනුයේත්, මාක්ස්වාදී මූලධර්ම මත ගොඩ නගන දෘෂ්ටිමය සමගි කිරීම මගින් පමනකි. දසලක්ෂ සංඛ්‍යාත වැඩ කරන්නන් කම්කරු පන්තියේ යුද්ධ හමුදාවට තරයේ සම්බන්ධ කරන්නේ මාක්ස්වාදයේ මූලධර්ම විසින් ශක්තිමත් කරන ලද සංවිධානයේ ද්‍රව්‍යමය සමගියයි.[6]

13. දෙවන සම්මේලනයෙන් ඉක්බිත්තේ, ලෙනින් එම භේදයට වගකිවයුතු යයි විශ්වාස කල ආර්එස්ඩීඑල්පීයේ බොහෝ කොටස්, ඔහුගේ අශමනීය ආස්ථානය කටුක ලෙස විවේචනය කලෝ ය. පක්ෂාභ්‍යන්තර අරගලය කෙරේ ඔහු දැක්වූ ආකල්පය දැඩි සේ විවේචනය කලවුන් අතර (එවකට 23 වියැතිව සිටි) තරුන ට්‍රොට්ස්කි ද රෝසා ලක්ෂම්බර්ග් ද වූහ. මෙවන් ශ්‍රේෂ්ඨ විප්ලවවාදීන් පවා තවමත් වටහා නොගත් දෙය නම් පක්ෂය ඇතුලත න්‍යායික, දේශපාලන සහ සංවිධානාත්මක විවාදයන් ද පක්ෂයෙන් පිටස්තරව මහා පරිමානව වර්ධනය වෙමින් පැවැත්තාවූ වෛෂයික පන්ති පෙලගැසීම ද, පන්ති සට්ටනය ද, පිලිබඳව ලෙනින්ට පැවති විනිවිද යන අභිනිවේෂයයි. තත්කාලීන බොහෝ සමාජවාදීන් ආර්එස්ඩීඑල්පීය ඇතුලත පාර්ශවයන් අතර පැවති සට්ටනය, දේශපාලන වශයෙන් තවමත් නොකැපවූ කම්කරු පන්තියක් මත තම බලපෑම තහවුරු කර ගැනීම උදෙසා යොමු වූවක් ලෙස ආත්මීය ආකාරයෙන් ගැනීමට නැඹුරුවූ නමුත්, ලෙනින් මෙම සට්ටනය දැක ගත්තේ පන්ති සම්බන්ධතාවන්හි සැබෑ මාරුවීම් වල - කම්කරු පක්ෂය හා ධනපති පන්තිය අතර ද කම්කරු පන්තියේම සමහර ස්ථරයන් අතර ද - වෛෂයික, ප්‍රකාශනයක් ලෙස ය. මේ අනුව ලෙනින් පක්ෂය තුල ප්‍රවනතාවයන්ගේ අරගලය විප්ලවවාදී යුගයේ වර්ධනයේ 'ඉතා වැදගත් දර්ශකයක්' ලෙස අධ්‍යයනය කලේ ය. දෙවන සම්මේලනය තුල පැන නැගි සට්ටනය සම්බන්ධයෙන් ගතහොත්, (පක්ෂ) ව්‍යවස්ථාව පිලිබඳ ප්‍රශ්නයට යටින් සැඟවී පැවැතියේ, රුසියානු කම්කරු පන්තිය ද, ආර්එස්ඩීඑල්පීය ද, ලිබරල් ධනපති පන්තිය සහ එහි දේශපාලන පක්ෂ

ද, කෙරේ දරා සිටිය යුත්තේ කුමන වර්ගයේ ආකල්පයක්ද යන්න ය. පක්ෂ සාමාජිකත්වයේ වගකීම් තීන්දු කිරීම වැනි සංවිධානාත්මක ප්‍රශ්න කෙරේ, මෙන්ෂෙවිකයන් දැරූ අවස්ථාවාදී ආකල්පයට යටින් පැවැත්තේ, රුසියානු ලිබරල්වාදය කෙරේ සම්මුතිවාදී යොමුවකි. කල්ගතවීමේ දී රුසියාව තුල දේශපාලන තත්වය මෝරායත්ම, ඉහත කී සංවිධානාත්මක ප්‍රශ්නවල අතිමහත් ගම්‍යයෝ පැහැදිලිව ම ඉස්මත්තට පැමිනියේ ය. පසු කලෙක ට්‍රොට්ස්කි ම පිලිගත් පරිදි, "දැවැන්ත පිපිරීම් සහගත සිද්ධීන් පසුබිමේ ඇතිව, වඩාත් නිවැරදි එනම් පන්තිය හා පක්ෂය අතරත්, න්‍යාය හා දේශපාලනය අතරත්, බොල්ශෙවික් සංකල්පය වර්ධනය කර ගනිද්දී, මට වරෙක භේදකාරිත්වය, කඩාකප්පල්කාරිත්වය යනාදී වශයෙන් පෙනීගිය දේ, දැන් කම්කරු පන්ති පක්ෂයේ විප්ලවවාදී ස්වාධීනතාව උදෙසා කරන ලද අතිශය ප්‍රශංසනීය වූත්, අනුපමේය ලෙස දූරදර්ශී වූත් අරගලයක් බව පෙනී යන්නේය."[7]

## නොනවතින විප්ලව න්‍යාය

14. 1903 සම්මේලනයේ භේදය රුසියාවේ මහා සමාජ පෙරලිය පිලිබඳ පූර්වාපේක්ෂනයක් විය. 1905 රුසියානු විප්ලවය, රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ඉදිරියේ විප්ලවවාදී මූලෝපාය පිලිබඳ තීරනාත්මක ගැටලු ඉස්මතු කලේ ය. 1905 විප්ලවයේ පරාජය තිබියදීම, එම වර්ෂයේ සිද්ධීන්, සාර්වාදයට එරෙහි අරගලයේ ප්‍රමුඛ භූමිකාව ඉටු කල කම්කරු පන්තියේ දැවැන්ත සමාජ බලය විදහා දැක්වීය. 1905 පෙරාතුව, විප්ලවයන් දැක ගන්නා ලද්දේ ජාතික සිද්ධීන් මාලාවක් ලෙස හා ඒවායේ ප්‍රතිඵලය, එම අභ්‍යන්තර සමාජ ආර්ථික ව්‍යුහය හා සම්බන්ධතාවල තර්කනය මගින් තීරනය කරන දෙයක් ලෙස ය. මාක්ස්වාදී න්‍යායඥයෝ සමාජවාදී විප්ලවය දියුනු යුරෝපීය ධනේශ්වර (බ්‍රිතාන්‍යය, ජර්මනිය සහ ප්‍රන්සය) රටවල ඇරඹෙනු ඇතැයි ද, රුසියාව වැනි අඩු දියුනු රටවල්, කම්කරු පන්තික සමාජවාදී විප්ලවය සඳහා මෝරා යාමට පෙරාතුව, ධනේශ්වර ආර්ථික හා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන වර්ධනයක් තුලින් ගමන් කරනු ඇතැයි ද උපකල්පනය කලහ. පසුව කී පසුගාමී රටවල මාක්ස්වාදී පක්ෂවලට කම්කරු පන්තියේ විප්ලවවාදී අරගලය ජාතික ධනපති නායකත්වය යටතේ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාන්ඩු පිහිටුවාලීමට පමනක් සීමා කිරීමට සිදුවනු ඇතැයි ඒත්තු ගෙන තිබුනි. රුසියානු මෙන්ෂෙවිකයන් මෙහෙයවනු ලැබුවේ ඉහත කී සම්ප්‍රදායික පර්යාලෝකය විසිනි. ප්ලෙහානොව්ගේ දේශපාලන මූලෝපාය හැඩගැසී තිබුනේ මේ අනුවය. කෙසේ වෙතත්, 1905 විප්ලවයේ දී, ධනේශ්වර පන්තිය සාර් රජුගේ පාලනයට එරෙහිව ධනේශ්වර ප්‍රජාතන්ත්‍ර විප්ලවය ඉෂ්ට කිරීමට අසමත් වූ අතර, සාර් සමග එක්ව කම්කරු පන්තියට විරුද්ධ ආස්ථානය ගත්තේ ය.

15. මෙන්ෂෙවික්වරුන්ට එරෙහිව ලෙනින් තර්ක කලේ ධනේශ්වර පන්තියේ දුබල බව නිසා විප්ලවය මෙහෙයවීම (එයට නායකත්වය දීම) කම්කරු පන්තිය විසින් කල යුතුව ඇති බවත්, එයට ගොවි ජනතාව සමග සන්ධානයක් අවශ්‍ය හෙයින් නිර්මානය කෙරෙන්නේ, කම්කරු පන්තිය සමග ගොවි ජනයාගේ ඒකාධිපතිත්වයක් බවත් ය. ලෙනින් ගේ මෙම සූත්‍රය ප්‍රජාතන්ත්‍රීය විප්ලවයට අවශ්‍යයෙන්ම රැඩිකල් ස්වභාවයක් අත් කර දීම (එනම්, පිටිසර පලාත්වල වැඩවසම් සම්බන්ධතා සම්මුති විරහිතව බිඳ දැමීම ද, රදල වංශාධිපති පාලනය අඩ ලෙස බිඳ දැමීම ද) සඳහා ඔහුට පැවති අධිෂ්ඨානය ප්‍රකාශයට පත් කල අතර, එය විප්ලවය වත්, එයින් පැනනගින රාජ්‍යයවත්, සමාජවාදී ආකාරයකින් නිර්වචනය නොකලේ ය. ප්‍රජාතන්ත්‍රවාදී ඒකාධිපතිත්වය, ධනේශ්වර දේපල ආකෘතීන් අත්පත්කර ගැනීමක් ඉල්ලා සිටියේ නැත. තව ද, කම්කරු පන්තිය හා ගොවි ජනතාව අතර බලය බෙදීම සම්බන්ධයෙන් ද එය ව්‍යාකූලත්වයක් ඇති කලේය.

16. ලියොන් ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යාය, රුසියාවේ ප්‍රජාතන්ත්‍ර විප්ලවය පිලිබඳ ප්‍රශ්නයට සෘජු පිලිතුරක් සම්පාදනය කලේ ය. ඔහුගේ සංකල්පය, සාර්වාදය පෙරලා දැමීම තුලින් පැන නංවන රාජ්‍යයේ පන්ති ස්වභාවය පිලිබඳ ප්‍රශ්නයේදී ලෙනින්ගේ සූත්‍රයෙහි පැවති දෙගිඩියාවෙන් තොර විය. විප්ලවය ප්‍රජාතන්ත්‍ර කර්තව්‍යයන්ට සීමා නොවන බව ට්‍රොට්ස්කි පූර්වභාෂනය කලේ ය; එය සමාජවාදී ස්වභාවයක් ගනු ඇත. කම්කරු පන්තිය බලය අතට ගෙන තමන්ගේම ඒකාධිපතිත්වයක් පිහිටුවනු ඇත. ට්‍රොට්ස්කි එලඹෙන රුසියන් විප්ලවයේ සමාජ ගතිකයන් පිලිබඳ තම විශ්ලේෂනය ධනේශ්වර පද්ධතියේ ජාත්‍යන්තර වර්ධනය මත පදනම් කලේ ය. ට්‍රොට්ස්කි කියා සිටියේ රුසියානු විප්ලවයේ ස්වභාවය, කර්තව්‍යයන් හා ප්‍රතිඵල අවසාන විග්‍රහයේ දී තීන්දු වනු ඇත්තේ ජාතික කොන්දේසිවලට වඩා ජාත්‍යන්තර සාධකයන් විසින් ය යන්න ය. රුසියානු ජනකාය මුහුන දුන් ක්ෂනික කර්තව්‍යයන්, ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවයක් - එනම් සාර්වාදී රදල වංශාධිපති පාලනය පෙරලා දැමීම, පිටිසර පලාත්වල වැඩවසම් සම්බන්ධතා විනාශකර දැමීම - ඉසිලූ නමුත් මෙම කර්තව්‍යයන් ජාතික ධනේශ්වරයේ දේශපාලන නායකත්වය යටතේ හෝ ධනේශ්වර ප්‍රජාතන්ත්‍ර සමූහාන්ඩුවක් යටතේ විසඳලිය නොහැකි ය. ලෝක ආර්ථිකයේ සාතිශය පරිවර්තනයන් ද කම්කරු පන්තිය අතිශයින් බලවත් සමාජ බලවේගයක් ලෙස ඉස්මත්තට ඒමේද අර්ථය වූයේ, 20 වන ශතවර්ෂයේ ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය 19 වන සියවසේ ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට වඩා බෙහෙවින් වෙනස් ආකාරයට වර්ධනය වනු ඇති බවය. රුසියානු ධනේශ්වරය ලෝක ධනේශ්වර පද්ධතියට ඒකාග්‍ර

කරගනු ලැබ පැවැතිනි. එය දුබල ද, ලෝක අධිරාජ්‍යවාදය මත ආසක්තවූයේ ද විය. ප්‍රජාතන්ත්‍ර කර්තව්‍යයන් සාක්ෂාත් කර ගත හැකිවූයේ ගොවි ජනතාවගේ සහාය ලත් කම්කරු පන්තිය විසින් මෙහෙයවුනු විප්ලවයක් මගින් පමනි. එහෙත් බලය සියතට ගත් කම්කරු පන්තියට ප්‍රජාතන්ත්‍ර කර්තව්‍යයන්ට සීමාවී ගෙන සිටිය නොහැකිය. එයට සමාජවාදී ස්වභාවයක් දරන්නා වූ පියවරයන් ගැනීමට සිදුවනු ඇත. එතකුදු නොව, රුසියාවේ සමාජ විප්ලවයට, ජාතික රාමුවක් තුලට සීමාවී ගෙන පැවතීමට ද, බැරි වනු ඇත. විප්ලවය රැකීගැනීම රඳපවත්නේ එය දියුනු ධනපති රටවලට ද පතුරුවා හැරීමෙනි; අන්තිමේදී මුලු ලොව පුරාම පතුරුවා හැරීමෙනි. මෙම ප්‍රතිඵලය ජනිත කල හැකි විභවය අන්තර්ගත වූයේ ලෝක ධනේශ්වර පද්ධතියේ තථ්‍ය වර්ධනයෙනි. 1905 ජූනි මාසයේ දී ට්‍රොට්ස්කි මෙසේ ලිවී ය.

> තම නිෂ්පාදන විධිය සහ වානිජ්‍යය මගින් සියලු රටවල් එක්කොට බැඳ දමමින්, ධනවාදය සමස්ත ලෝකයම තනි ආර්ථික හා දේශපාලන ප්‍රානියෙකු බවට පරිවර්තනය කර තිබේ. දැන් දරන හරිමින් සිටුනා සිද්ධීන්ට ජාත්‍යන්තර ස්වභාවයක් ලබා දෙමින් එය, පෘථුල දෘෂ්ටි මානයක් විවෘත කරයි. කම්කරු පන්තිය නායකත්වය දී ඉටු කරනු ලබන රුසියාවේ දේශපාලන විමුක්තිය විසින්, එම පන්තිය මෙතෙක් ඉතිහාසයේ නොදන්නා ලද උසකට ඔසවා තබනු ඇත. එම පන්තිය අතට සුවිසල් බලයක් හා සම්පත් ද පත් කොට, ලෝක ධනවාදය විනාශ කර දැමීමේ ක්‍රියාවලියෙහි ආරම්භකයා බවට එය පත් කරනු ඇත. ඉතිහාසය මේ සඳහා සකල වෛෂයික තත්වයන්ම නිර්මානය කර ඇත.[8]

## ලෙනින් භෞතිකවාදය ආරක්ෂා කිරීම

17. ඉක්බිති වර්ෂවල දී ට්‍රොට්ස්කි, ලෙනින්ගේ වැඩ කටයුතු ඉහලම මට්ටමක න්‍යායික දැනුවත් බවකින් සුවිශේෂිත වී යයි සඳහන් කලේ ය. මෙම සුවිශේෂිත බව ලෙනින්, සමාජවාදී ව්‍යාපාරය අවමංගත කිරීමට තර්ජනය කල දාර්ශනික විඥානවාදයේ හා ආත්මීයවාදයේ විවිධ රූපාකාරයන්ට එරෙහිව මාක්ස්වාදය අප්‍රතිහත ලෙස ආරක්ෂා කිරීම තුලින් ප්‍රකාශිත විය. *භෞතිකවාදය සහ අනුභූතිවාදී විචාරය* (1908-09) ලිවීමට අවුරුද්දක්ම කැප කිරීමට ලෙනින් ගත් තීන්දුව ප්‍රකාශ කලේ, සමාජවාදී ව්‍යාපාරය තුල දාර්ශනික විඥානවාදයේ පෘථුල බලපෑම මගින්, සමාජවාදය, සදාචාරය මත පදනම් කිරීමට දරන ලද ප්‍රයත්නයන් සමග, නිතරම බැඳී පැවැතුනු නව්‍ය කාන්ටියානුවාදය පමනක් නොව, ස්වේච්ඡාවාදය හා ක්‍රියාව සඳහා ආත්මීය අධිෂ්ඨානය උත්කර්ෂයට නැංවූ, ෂෝපනෝවර්ගේ ද නියේෂේගේ ද බලපෑම ප්‍රකාශිත කරන්නා වූ, විවෘතව ම අහේතුකවාදී සංකල්පයන් ද විසින් මතු කල දැවැන්ත අන්තරාය පිලිබඳව ඔහු කොතරම් දැනුවත්ව සිටියේ ද යන්නය. ධනේශ්වර සමාජය පාලනය කරන නීති පිලිබඳ විද්‍යාත්මක අවබෝධය හා විප්ලවවාදී අරගලයත් සමග එකිනෙකට නොපෑහෙන බැවින්, ලෙනින් ආත්මීයවාදයට විරුද්ධ විය.

18. "මාක්ස්වාදයේ දර්ශනවාදය වනාහි භෞතිකවාදයයි" යන්න ලෙනින් අවධාරනය කලේ ය. "ස්ථිරසාර භාවයකින් යුක්ත වූ ද නවීන විද්‍යාවේ සියලුම උගැන්වීම්වලට අනුකූලවූ ද, මිථ්‍යා මතයන්ට හා ආගමික දෙඩවිලි යනාදියට සතුරු වූ ද එකම දර්ශනවාදය ලෙස" මාක්ස්වාදය තහවුරුව ඇතැයි ලෙනින් ප්‍රකාශ කලේ ය. භෞතිකවාදය දහඅටවන සියවසේ පැවැති ස්වරූපයෙන් ඔබ්බට පොහොසත් කොට වර්ධනය කරනු ලැබුවේ මාක්ස්වාදය විසින් බව ලෙනින් පැහැදිලි කලේ ය. එය සිදු වූයේ, "පසුව ෆොයර්බාක් ගේ භෞතිකවාදයට දොර හැරදුන් ජර්මානු සම්භාව්‍ය දර්ශනවාදයේ, විශේෂයෙන් ම හේගල්ගේ පද්ධතිය අත් කරගත් ජයග්‍රහනයන්" මගින් යයි ලෙනින් පැහැදිලි කලේ ය. ජර්මානු සම්භාව්‍ය දර්ශනවාදයේ ඉමහත් ප්‍රතිපදානය වූයේ අපෝහකය විස්තාරනය කිරීමය. "වර්ධනය එහි පරිපූර්න, ගැඹුරු, සහ සාකල්‍යමය ස්වරූපයෙන් විස්තර කරලන්නාවූ, සදා වර්ධනය වන පදාර්ථයේ පිලිබිඹුවක් අපට සපයා දෙන මනුෂ්‍ය ඥානයේ සාපේක්ෂතාව පිලිබඳ න්‍යායධර්මය අපෝහකය බව" ලෙනින් පැහැදිලි කලේ ය.[9] පලමුවන ලෝක යුද්ධයේ මුවවිට දී ලෙනින් මාක්ස්වාදයේ දාර්ශනික ආස්ථානය පිලිබඳව පහත සඳහන් සංක්ෂිප්ත පැහැදිලි කිරීම කලේය.

> --මාක්ස් දාර්ශනික භෞතිකවාදය, ස්වභාවධර්මය ඥානනය මානව සමාජය ඥානනය කිරීම අන්තර්ගත කර ගන්නා තෙක් ම ගැඹුරු කර, පරිපූර්නත්වය කරා ම වර්ධනය කලේ ය. ඔහුගේ ඓතිහාසික භෞතිකවාදය විද්‍යාත්මක චින්තනය ලත් මහා ජයග්‍රහනයකි. ඉතිහාසය හා දේශපාලනය පිලිබඳ දෘෂ්ටියෙහි ඉන් පෙර කල රජකල වියවුල හා හිතුවක්කාරය අහෝසි කොට, ඒ වෙනුවට සිත් කාවදින පරිදි ඒකාග්‍රවූ ද සමවායවූ ද විද්‍යාත්මක න්‍යායක් තහවුරු කරන ලදී. එම න්‍යාය නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනය හේතු කොට ගෙන සමාජ ජීවිතයේ එක් පද්ධතියක් තුලින් තවත් වඩා දියුනු පද්ධතියක් වර්ධනය වන්නේ කෙසේ ද යන්න, උදාහරනයක් හැටියට ධනේශ්වර ක්‍රමය වැඩවසම් ක්‍රමය තුලින් වැඩී එන්නේ කෙසේ ද යන්න පෙන්නුම් කරයි.

මිනිසාගේ ඥානය, ඔහුගෙන් ස්වාධීනව පවතින්නා වූ ස්වභාවය (එනම් වර්ධනය වන්නා වූ පදාර්ථය) පිලිබිඹු කරන්නේ යම්සේ ද, එසේම මිනිසා සමාජ ඥානය තුලින් (එනම් ඔහුගේ විවිධ මත හා න්‍යාය - දාර්ශනික, ආගමික හා දේශපාලන යනාදී වශයෙන්.) සමාජයේ ආර්ථික පද්ධතිය පිලිබිඹු කරයි. දේශපාලන ආයතන වනාහී ආර්ථික පදනම මත ගොඩ නැගුනු උපරි ව්‍යුහයකි. උදාහරනයක් හැටියට අප දකින වත්මන් යුරෝපීය රාජ්‍යවල විවිධ දේශපාලන රූපාකාරයෝ, කම්කරු පන්තිය මත ධනේශ්වරයේ ආධිපත්‍යය ශක්තිමත් කර ලීමට ආධාර වෙති.

මාක්ස්ගේ දර්ශනවාදය වනාහී මිනිස් වර්ගයාට ද, විශේෂයෙන්ම කම්කරු පන්තියට ද, ඥානයේ බලගතු උපකරන සම්පාදනය කර දී ඇති අංග සම්පූර්න දාර්ශනික භෞතිකවාදයකි."[10]

19. 1922 දී ජෝර්ජ් ලූකාෂ්ගේ ඉතිහාසය සහ පන්ති විඥ්ඥානය (හිස්ට්‍රි ඇන්ඩ් ක්ලාස් කොන්ෂස්නස් ) නම් කෘතිය පල කල තැන් පටන්, සමාජවාදී ව්‍යාපාරය ඇතුලත ද එහි අද්දර ද සිටගත් ශාස්ත්‍රාලික විඥ්ඥානවාදී ශික්ෂනයක් ලත් බුද්ධිමතුන් විසින්, අපෝහකය භෞතිකවාදවයට එරෙහිව පිහිටුවාලීමට ද, ලෙනින්ගේ භෞතිකවාදය හා අනුභූතික විචාරය (මැටීරියලිස්ම් ඇන් එම්පිරියෝ ක්‍රිටිසිසම්) වැනි කෘතීන් 1914-15 දී තමා හේගල්ගේ තර්කයේ විද්‍යාව (සයන්ස් ඔෆ් ලොජික්) හැදෑරීමට පටන් ගත්තායින් පසුව ලෙනින් විසින් ප්‍රතික්ෂේප කලේ යයි උපකල්පනය කර ගත් " ග්‍රාම්‍ය භෞතිකවාදය" පිලිබඳ උදාහරනයක් යයි හෙලාදැකීමට පවා ද, දුෂ්යත්නයන් දරනු ලැබ ඇත. එවන් දුෂ් අර්ථ කථන, දාර්ශනික කටු සටහන් පොත් (ෆිලෝසොෆිකල් නෝට් බුක්ස්) පමනක් නොව ලෙනින්ගේ සම්පූර්න බුද්ධිමය ජීවන ප්‍රවෘත්තිය ම මුලුමනින්ම විකෘත කිරීම මගින්, සෝවියට් සංගමය තුල ස්ටැලින්වාදය ජයග්‍රහනය කිරීම ද, ජර්මනියේ ෆැසිස්ට්වාදයේ නැගීම ද, යුරෝපය පුරාම න්‍යායික වශයෙන් අධ්‍යාපිත විප්ලවවාදී කාර්යධරයන් විශාල කොටස් වනසා දැමීම ද, පසුබිම් කර ගනිමින් සම්භාව්‍ය මාක්ස්වාදයේ අඩිතාලම්වලට හා උරුමයට එල්ල කැරුනු ධනේශ්වර ප්‍රහාරය තුල දී, ප්‍රමුඛ කාර්ය භාරයක් ඉෂ්ට කලේ ය. විඥ්ඥානවාදීන් හුදෙක් වාගාලාපමය ප්‍රසංශාවකට පාත්‍ර කල මෙම "අපෝහකය", ලෙනින් විසින් ඉදිරිපත් කරන ලද "වර්ධනයේ න්‍යාය" හා එංගල්ස්ගේ "දේවල් හා ජීවා අතර ඇති සාරභූත සම්බන්ධය, සම්පතනය, චලනය, උපත සහ අභාවය වටහා ගන්නේ ය"[11] යනුවෙන් විස්තර කරන ලද විද්‍යාත්මක විධික්‍රමය සමග මොනම සම්බන්ධයක්වත් ඇත්තේ නැත. ඒ වෙනුවට එය ස්වභාවය, එනම් මිනිසාට පෙරාතුව සහ මිනිසාගෙන් ස්වාධීනව පවත්නා ද්‍රව්‍යමය විශ්වය අතහැර දැමූ - "අපෝහකයක්" විය. එය වනාහී ආත්මීයව සංකල්පනය කරගන්නා ලද අතෘප්තියට පත් බුද්ධිමතා සහ ඔහුගේ පරිසරය, අතර අන්තර් ක්‍රියාකාරිත්වය පිලිබඳ ව්‍යාජ-අපෝහකයක්, වූයේ ය. (වන්නේ ද වෙයි.) (එම සංකල්පයට අනුව) - ස්වභාවයේ සමාජයේ හා විඥ්ඥානයේ වර්ධනය පාලනය කරන්නාවූ වෛෂයික නීති වලින් නොබැඳී තමාටම උචිත ආකාරයට ලෝකය "නිර්මානය" කිරීමට පුද්ගලයා නිදහස් ව සිටියි.

## මතු සම්බන්ධයි.

## සටහන්

[1] Frederic Engels, *Anti-Dühring,*in *Marx-Engels Collected Workers* ල ෆ්‍රෙඩ්රික් එංගල්ස්, ඩූරිංට ප්‍රතිපක්ෂව ලිපිය, මාර්ක්ස්-එංගල්ස් තෝරාගත් කෘති, වෙලුම 25 (නිව් යෝර්ක්ඃ ඉන්ටර් නැෂනල් පබ්ලිෂර්ස්, 1987), පි. 254-55.

[2].*ලෙනින්, තෝරාගත් කෘති වෙලුම් දොලහ*, 1 වෙලුම, කල යුත්තේ කුමක්ද? (මොස්කව්, ප්‍රගති ප්‍රකාශන මන්දිරය, 1979), පි.152-53.

[3].එම, පි. 153-54.

[4]. *ලෙනින්, තෝරාගත් කෘති වෙලුම් දොලහ*, 2 වෙලුම *පියවරක් ඉදිරියට, පියවර දෙකක් පස්සට* , (මොස්කව්, ප්‍රගති ප්‍රකාශන මන්දිරය, 1979), පි. 216.

[5]. එම, පි. 213

[6]. එම, පි. 234-35.

[7].*The Challenge of the Left Opposition* වාම විපාර්ශවයේ අභියෝගය (1923-25) කෘතියේ "අපේ වෙනස," ලිපියේ, (නිව් යෝර්ක්ඃ පාත්ෆයින්ඩර් ප්‍රෙස්, 2002), පි. 299.

[8]. Leon Trotsky, *ThePermanent Revolution* ලියොන් ට්‍රොට්ස්කි, නොනවතින විප්ලවය (ලන්ඩන්ඃ නිව් පාර්ක්, 1971), පි. 240.

[9]. "මාක්ස්වාදයේ මූලාශ්‍රයන් තුන සහ එහි සංයුක්ත කොටස් තුන," *Three Sources and Three Component Parts of Marxism* in:*Collected Works* (ලෙනින් සංගෘහිත කෘති, වෙලුම 19, මොස්කව්ඃ ප්‍රෝග්‍රෙස් පබ්ලිෂර්ස්, 1968), පි.24.

[10].එම, පි. 25.

[11].(*Anti-Dühring,* in:*Marx-Engels Collected Works*, මාක්ස් එංගල්ස් සංගෘහිත කෘති) 25 වෙලුම, 23 පිට.

© www.wsws.org